# වවුනියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## උපකුලපති තනතුර

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වැනි වගන්තිය සහ ඉන් පසුව සිදුකල සංශෝධනයන් ප්‍රකාරව ක්‍රියාකරන ශ්‍රී ලංකාවේ වවුනියා විශ්වවිද්‍යාලයේ පාලක සභාව වවුනියා විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. 2023.04.10 දිනැති අංක 03/2023 චක්‍රලේඛයේ දක්වා ඇති ආකාරයට තෝරා ගැනීම සිදු කරන බව අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ. පහත UGC වෙබ් අඩවියට පිවිසීමෙන් විස්තර ලබාගත හැකිය.

https://www.ugc.ac.lk/attachments/2442_Commission%20Circular%20No.%2003-2023.pdf

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් යොමු කරන දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. තෝරාගත් අයදුම්කරු පත්වීමේ දිනයේ සිට වසර තුනක කාලයක් හෝ ඔහු / ඇය 65 වන වසර සම්පූර්ණ වන තුරු, මෙයින් පෙර සිදු වන දෙයක් සඳහා ධුරය දරනු ඇත. වවුනියා විශ්ව විද්‍යාලයේ දැක්ම වන්නේ තිරසාර වෙනසක් සඳහා වූ දැනුම උසස් කිරීම සහ ව්‍යාප්තිය යන අංශවල විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමයි. එහි ප්‍රමුඛතා වන්නේ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, තව්‍ය පර්යේෂණ සහ ජාතියේ සහ කලාපයේ තිරසාර සංවර්ධනය කිරීමට උපාධිධාරීන් සවිබල ගැන්වීම සඳහා ක්‍රියාකාරී දායකත්වය ලබා දීමයි. මෙම විශ්වවිද්‍යාලය පීඨ තුනකින් සමන්විත වන අතර, ආසන්න වශයෙන් උපාධි අපේක්ෂකයින් තුන් දහසක් පමණ වන සිසුන් පිරිසකට වෘත්තීමය හා පිළිගත් උපාධි පාඨමාලා සපයනු ලබයි. මෙම ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා සහාය දීම උපකුලපතිවරයාගෙන් අපේක්ෂා කෙරේ.

2. උපකුලපතිවරයා ඔහුගේ / ඇයගේ බුද්ධිමය මෙන්ම කළමනාකරණ දක්ෂතාව තුළින් විශ්ව විද්‍යාලයේ දැක්ම සහ අරමුණු ඉදිරියට ගෙන යාමේ දැක්මක් ඇති පුද්ගලයෙකු විය යුතුය. මෙයට අමතරව, උසස් අධ්‍යාපනයේ ජාතික ප්‍රතිපත්ති අනුව ජාතියේ අවශ්‍යතා හඳුනා ගැනීමට උපකුලපතිවරයාගෙන් ඉල්ලා සිටියි. උපකුලපතිවරයාට තම නායකත්වය සහ පර්යේෂණ හා සංවර්ධන ඇතුළු අධ්‍යයන කටයුතු තුළින් විශ්වවිද්‍යාලයේ ප්‍රගමනය සඳහා කාලය විසින් පරීක්ෂා කරන ලද වටිනාකම් ශක්තිමත් කිරීමට හැකි විය යුතුය. එබැවින් අයදුම්කරු ශක්තිමත් පර්යේෂණ පැතිකඩක් ඔප්පු කරන ලද නායකත්ව ගුණාංග සහ විවිධ උනන්දුවක් දක්වන කණ්ඩායම් සමඟ අන්තර් ක්‍රියා කිරීමට අන්තර් පුද්ගල කුසලතා, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ විශිෂ්ඨ ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් සහිත උසස් අධ්‍යාපනික හා අවංක පුද්ගලයකු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ විවිධ අවශ්‍යතා උත්තේජනය කිරීමේ හැකියාව සමඟ විශිෂ්ට සන්නිවේදන කුසලතා සහිත තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි විය යුතුය.

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර, ප්‍රධාන විධායක මෙන්ම ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද වේ. උපකුලපතිවරයා විශ්ව විද්‍යාලයේ ගණකාධිකාරිවරයා ද වේ. ඔහු / ඇය නිල සාමාජිකයෙක් වන අතර පාලක සභාවේ සහ සනාථන සභාවේ සභාපතිවරයා වේ. ඔහු / ඇය විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරයි. විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන සහ සුදුසු උපදෙස් නිසි ලෙස පිළිපැදීම සහතික කිරීම උපකුලපතිවරයාගේ යුතුකම වන අතර, ඒ සඳහා ඔහු / ඇය අවශ්‍ය යැයි සිතිය හැකි සියලු බලතල ක්‍රියාත්මක කළ යුතුය.

අධ්‍යයන නායකත්වය සැපයීම සඳහා උපකුලපතිවරයා වගකිව යුතු අතර, විධිමත් කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, හඳුන්වාදීම හා මෙහෙයවීම සහ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය යන පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරයි. එබැවින් අධ්‍යයන විශිෂ්ටත්වය සහ යහපාලනය පිළිබඳ මූලධර්ම පිළිගත යුතුය. විනිවිදභාවය, වගකීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය සහ ඵලදායී පක්ෂග්‍රාහී නොවන නායකත්වයක් පවත්වා ගැනීම සඳහා උපකුලපතිවරයා වගකිව යුතුය. වවුනියා විශ්වවිද්‍යාලයේ උපකුලපති වීමට අපේක්ෂා කරන පුද්ගලයාට උපායශීලී හා නිපුණතාවයෙන් ස්ථාවර, ඉල්ලීම් සහ ආතති සහගත තත්වයන් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමට හැකි විය යුතුය. ඔහු / ඇය අනැති කර්තව්‍යය අනුව දිගු වේලාවක් වැඩ කිරීමට හැකියාව තිබිය යුතුය. උපකුලපතිවරයා විශ්ව විද්‍යාල පද්ධතියේ ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයට සුදුසුකම් ලබා ඇති අතර, වැටුපෙන් 15% ක විනෝදස්වාද දීමනාවක් සඳහා හිමිකම් ලබයි.

3. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලි තිබිය යුතුය:

(i) උපන්දිනය ඇතුලුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව.

(ii) විශ්ව විද්‍යාලයේ සංවර්ධනය පිළිබඳ දැක්ම ප්‍රකාශයක් සහ පත්කරනු ලැබුවහොත් අපේක්ෂකයා අත්කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.

(iii) වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු හෝ අයදුම්කාරියකු මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරය හෙබවූයේ නම්, ඔහු / ඇය ඉහත (ii) ඡේදයේ සඳහන් ලියකියවිලි වලට අමතරව ඔහුගේ / ඇයගේ පූර්ව ධූර කාලය තුළ සිදුකරන ලද ජයග්‍රහණ ඉස්මතු කරන වාර්තාවක් ලබා දිය යුතුය.

(iv) වවුනියා විශ්වවිද්‍යාලයට අමතරව රාජ්‍ය අංශයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු ඔහු / ඇය තනතුරට පත්වූ අවස්ථාවකදී ඔහු / ඇය නිදහස් කළ හැකිද යන්න සේවා යෝජකයාගේ ලිපියක්.

අයදුම්පත් මුද්‍රා තැබූ කවරයක / ලියුම් කවරයක, පාලක සභාවේ ලේකම්, ලේඛකාධිකාරී කාර්යාලය, වවුනියා විශ්වවිද්‍යාලය, මන්නාරම පාර, පම්පයිමඩු, වවුනියාව" යන ලිපිනයට **21.02.2024** වන දින ප.ව. **3.00** ට පෙර භාරදීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට හැකි වන පරිදි එවීමට හැකිය. අයදුම්පත් ඇතුළත් ලියුම් කවරය එහි ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර"** ලෙස සඳහන් කළ යුතුය.

ඊට අමතරව, 21.02.2024 දින අවසන් වීමට පෙර ඉහත ලේඛනවල මෘදු පිටපතක් සහ වෙනත් ඕනෑම උපකාරක ලියකියවිලි **PDF** ආකෘතියෙන් මාගේ විද්‍යුත් තැපැල් ලිපිනයට **registrar@vau.ac.lk** ඉදිරිපත් කළ යුතුය.

4. UGC චක්‍රලේඛය අංක 03/2023 හි දක්වා ඇති පරිදි ඇගයීම සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයෙන් පසුව මාස දෙකක් ඇතුලත වැඩකරන දිනයක පාලක සභාවේ ලේකම්වරයා විසින් විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලැබේ. සුවිශේෂී තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකුට විශේෂ පාලක සභා රැස්වීමට පෙනී සිටීමට හැකියාවක් නොමැති නම්, ඔහුට /ඇයට ලේකම්වරයා වෙත පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව අතථ්‍ය මාදිලිය හරහා පෙනී සිටීමට අවසර ලබාදිය හැකිය.

අපේක්ෂකයින් අවම වශයෙන් මිනිත්තු දහයක (10) නමුත් විනාඩි පහළොවක් (15) නොඉක්මවන කාල සීමාවක් තුළ කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා විශේෂ පාලක සභා රැස්වීමට කැඳවනු ලැබේ. කෙසේ වෙතත්, එම අයදුම්කරු සභාවේ සාමාජිකයෙකු වුවද, වෙනත් කිසිදු අයදුම්කරුවෙකුට විශේෂ පාලක සභා රැස්වීමේ රැස්වීම් ස්ථානයේ රැඳී සිටීමට හෝ වෙනත් අපේක්ෂකයින්ගේ ඉදිරිපත් කිරීම්වලට සවන් දීමට අවසර නොදේ.

UGC චක්‍රලේඛ අංක 03/2023 හි දක්වා ඇති පරිදි අපේක්ෂකයින්ගේ නම් තුනක් නිර්දේශ කරමින් විශේෂ පාලක සභා රැස්වීමේ වාර්තාව සකස් කර සියලුම ලියකියවිලි සමඟ වැඩිදුර කටයුතු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා නොබලන බව දන්වා සිටිමි.

**පාලක සභාවේ ලේකම් සහ ලේඛකාධිකාරී,**
**වවුනියා විශ්වවිද්‍යාලය.**
**19.01.2024**